විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

ஓய்வூதியத் திணைக்களம்
DEPARTMENT OF PENSIONS

ශ්‍රී ලංකා විශ්‍රාම
இலங்கை ஓய்வு
Sri Lanka Pensions

පරපුරක අභිමානය　　தலைமுறையொன்றின் பெருமிதம்　　Pride of a Generation

මගේ අංකය / எனது இல. / My No. } විවැ/පා10/විභාග/2023　　ඔබේ අංකය / உமது இல. / Your No. } ..........................　　දිනය / திகதி / Date } 2023.01.31

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්/ ප්‍රාදේශීය ලේකම්වරුන්
ප්‍රධාන කාර්යාලයේ අංශ භාර මාණ්ඩලික නිලධාරීන් මඟින්,
සියලුම නිලධාරීන් වෙත.

<u>දිවයිනේ ජාතික හා පළාත් පාසල්වල පවතින සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය ගුරු පුරප්පාඩු සඳහා රාජ්‍ය සේවයේ නියුතු උපාධිධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයට බඳවා ගැනීමේ තරඟ විභාගය - 2023</u>

අංක 2317 හා 2023.01.27 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කර ඇති **"දිවයිනේ ජාතික හා පළාත් පාසල්වල පවතින සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය ගුරු පුරප්පාඩු සඳහා රාජ්‍ය සේවයේ නියුතු උපාධිධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයට බඳවා ගැනීමේ තරඟ විභාගය - 2023 "** යන ගැසට් නිවේදනය හා බැඳේ.

02. උක්ත විභාගය සඳහා අයදුම් කිරීමට අපේක්ෂා කරන මෙම දෙපාර්තමේන්තුව යටතේ සේවයේ නියුතු අයදුම්කරුවන් විභාග දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය වෙත පිවිස මාර්ගගත පද්ධතිය ඔස්සේ ( online) යොමු කළ අයදුම්පතෙහි මුද්‍රිත පිටපතක් ලබා ගෙන අනුයුක්ත කාර්යාලයේ ප්‍රධානියා (දිස්ත්‍රික් ලේකම්, ප්‍රාදේශීය ලේකම්/ අංශ භාර මාණ්ඩලික නිලධාරි) මඟින් අත්සන සනාථ කර ඉදිරි කටයුතු කිරීම සඳහා කඩිනමින් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ පාලන අංශය වෙත තැපැල් මඟින් යොමු කළ යුතු බව කාරුණිකව දන්වමි.

02. අයදුම්පත් 2023.02.10 වන දින වන විට විභාග දෙපාර්තමේන්තුව වෙත පෞද්ගලික ලිපිගොනුව හරහා යොමු කළ යුතු බැවින් ඉහත පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2023.02.07 වන දින හෝ ඊට පෙර ලැබෙන සේ තැපැල් මඟින් දෙපාර්මේන්තුව වෙත ලැබෙන පරිදි යොමු කිරීමට කටයුතු කළ යුතුය. එදිනට පසු දෙපාර්තමේන්තුව වෙත ලැබෙන අයදුම්පත් විභාග දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම ප්‍රමාද වීම සම්බන්ධයෙන් වන වගකීම අදාල අයදුම්කරු විසින් භාරගත යුතු බව ද වැඩිදුරටත් දන්වමි.

ඩී.එම්.ආර්. දිසානායක
අධ්‍යක්ෂ (පාලන) වැ.බ.
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට

මාළිගාවත්ත, කොළඹ 10. மாளிகாவத்தை கொழும்பு 10. Maligawatta, Colombo 10.
Hot line: 1970, Direct line: 2209800, Fax: 2342078, Email: info@pensions.gov.lk, Web: www.pensions.gov.lk